# අස්වැන්න නැතිව යාමෙන් හෙළයින්ට අහිමි වූ මහාවංශය

ජේ . ඒ. එල් . පී . ජයකොඩි
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරී
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**සමාජයේ ප්‍රගමනය උදෙසා කාලීන වූ ද ප්‍රායෝගිකවූ ද ක්‍රියා මාර්ග ගැනීම සත් කටයුත්තක් බව අවිවාදාත්මක ය. නමුත් දීර්ඝ කාලීන අත්දැකීම් තුළින් ලත් යම් යම් දේශීය වශයෙන් වැදගත් එමෙන් ම උචිත තාක්‍ෂණික ක්‍රම අවිචාරවත් ලෙස බැහැර කරලීම කිසිසේත් ළඝු කොට නොසැලකිය යුතු ය. නූතන ලෝකයේ විද්වත්හු සහ උගත්තු පරිසරයට වඩා හිතකර ගොවිතැන් ක්‍රම භාවිතා කිරීමෙන් ලබා ගනු ලබන ආහාර ද්‍රව්‍ය. මනුෂ්‍යයාගේ සෞඛ්‍යයට ද වඩා උචිත බව සලකති. 20 වන සියවසේ අවසන් දශකය ගත කරන ශ්‍රී ලාංකිකයින් මෙයට වසර සිය ගණනකට පෙර. පරිසර තුල්‍යතාවයට තර්ජනයක් නොවන අයුරින් වී ගොවිතැන කළ ආකාරය පිළිබඳ කෙරෙන සංක්‍ෂිප්ත හැඳින්වීමකි මෙය.**

සෞභාග්‍යමත් දිවි පෙවෙතක් ගත කළ අප මුතුන් මිත්තන් සාරධර්ම අතින් ද පරිපූර්ණ වූවෝ වූහ . ඔවුන්ගේ විශ්මිත කලා නිර්මාණ දෙස නෙත් යොමු කිරීමෙන් අද මෙන් අතිධාවනකාරී මගකට පිවිස වෙහෙසකට පත් නොවූ බව විවේකී මනසකින් යුතුව කළ එම නිර්මාණ දෙස් දෙයි . වී ගොවිතැන ප්‍රධාන කොටගත් ඔවුන්ගේ සමබර දිවි පෙවෙත ස්වභාව ධර්මයට අනුකූල වූවක් විය . වර්තමානයේ මෙන් ම ඉතා ඈත ඉතිහාසයේ ද මෙරට වගා කරන ලද ප්‍රධාන බෝගය "සාලි" හෙවත් වී (වීය ) බැව් සඳහන් වේ . "ගයිගර්" පවසන ආකාරයට සාලි නම් වර්ගය වවන ලද්දේ කඳුකර ප්‍රදේශයේ අහස් දිය පමණක් ප්‍රමාණවත් වන කුඹුරු වලය . මෙය මෙකල "හෙල්මළු" ක්‍රමයට සමාන වූවකැයි උපකල්පනය කළ හැක. එමෙන් ම කඳුකර ප්‍රදේශ වල වැවෙන විශේෂ වී වර්ග වූ බවද සඳහන් වේ . 16 වන සියවසේ දී වීරවික්‍රම රජු සියතින් ම කුඹුරක වී වපුරා (සාලි ඛෙත්ත) ලැබූ අස්වැන්නෙන් විශේෂ දානමය පුණ්‍ය කර්මයක් සිදු කරගත් බැව් සඳහන් වන අතර ක්‍රි . පූ. අවසන් සියවසේ මහාචූල මහාතිස්ස රජ වෙස් වලාගෙන ගොයම් කැපීමෙන් (සාලි - ලවන ) ලබාගත් වේතනයෙන් දානයක් දුන් බව පැරණි මහාවංශ ඡේදයක දැක්වේ . එමෙන් ම සෑම වප් මඟුල් කටයුත්තක් ම පාහේ රජතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය පෙරටු කොට සිදුවූ අතර , නොක්ස් පවසන අයුරින් එකල කෙතරම් උසස් කුළීන පෙලපතකට අයත් වූවෙකු වූවද, නඟුල ගෙන සී සෑම අගෞරවයක් සේ නොසැලකුණ බැවිනුත්, ගොවිතැන මෙරට ජනයාගේ ජන ජීවිතයට උසස් මෙන් ම සමීපතම වූ කාර්‍යයක් බවට පත්විය යන්න පැහැදිලි වේ . කෙසේ වුවද ලැමනිතිස් රජුට පසුව රාජ්‍යත්වයට පත්වූ මිස්නෙන් රජ හට "කරල් සොරා" යන නම ව්‍යවහාර විම රාජාවලිය, සුළු රාජාවලිය, පූජාවලිය යන ග්‍රන්ථ සියල්ලෙන්ම විද්‍යාමාන වේ. නමුත් රාජ්‍යත්වය ලැබුවෙකුට මෙලෙසින් ව්‍යවහාර කිරීමට හේතුව කිමෙක් දැයි විමසිය යුතු කරුණක් වේ .

එමෙන් ම මහා වංශයේ අවසානයත් චූල වංශයේ ආරම්භයත් පිළිබඳ කරුණු දක්වන රාජාවලියේ පහත සඳහන් පාඨයන් මාහාවංශයේ බිඳ වැටීමට හේතුවූ කරුණු ලෙස පැහැදිලි කර තිබේ .

"සුළු වංශය නම්, මව් පක්ෂයවත් පිය පක්ෂයවත් දෙකින් එකක් සූර්‍ය කුලයෙන් තිබෙයි. එකක් ශ්‍රී මහා බෝධිය ගෙනා වංශයත් දළදා ගෙනා වංශයත් කලබැගෑනිව තිබ්මෙන් පැවත එන නිසා, සංඝරත්නය ඍධිගමන් අත්හල සහ තෙරුවන් නැති නිසාත්, ශක්‍රයා මේ සිරිලක නොබලන නිසාත්, පින් ඇති කෙනෙක් නැති නිසාත්, අනුරාධපුරය පාළුවෙන නිසාත්, රටට බීජු ඵලදාව අඩුවන නිසාත් බීජු කුඩාව යන නිසාත් සුළු වංශය නම් විය."

ඊට අනුව එහි සඳහන් වූ කරුණු අතර **බීජ අස්වැන්න අඩු වීමත් බීජ වල විශාලත්වය නැතිව යාමත්** ප්‍රමුඛ ස්ථානයක් ගත් බව හෙළිවේ .

ඉතා ඈත අතීතයේ පවා මෙරට ගොවි ජනතාව කන්න තුනක් වගා කළ බවට සාධක හමුවී ඇත . මහසෙන් රජුගේ පුත් කිත්සිරිමෙවන් රජ ( ක්‍රි . ව . 362 - 389 ) විසින් කරවන ලද සුප්‍රසිද්ධ තෝනිගල ගිරි ලිපියෙන් මේ බැව් පැවසේ .එහි පූජාවන් සඳහා එක් එක් කන්නයෙන් ලැබෙන අස්වැන්නෙන් වෙන් කළ යුතු පංගු පිළිබඳව සඳහන් වන ස්ථානයේ දී වගා කන්න පිළිබඳ පැහැදිලි සටහනක් හමු වේ. "පිට දඩ හස", "අකල හස", " මදෙහස" ලෙස වී ගොවි තැන් කළ කන්න තුනක් තෝනිගල ගිරි ලිපියේ සඳහන් වේ. "පිට දඩ හස" යන්නේ අදහස, වියළි කලාපයට ඉහළ වර්ෂාපතනයක් ලබා දෙන ඊසාන දිග මෝසම් කාලය හෙවත් මෙකල ව්‍යවහාර වන මහ කන්නය වේ . "අකලහස" යන්නෙන් අකාල නොහොත් ප්‍රමාණවත් වැසි නොලැබෙන යල කන්නය හැඳින්වේ. (සංස්කෘත සහ පාලි : අකාල යන්න නියම කල හෙවත් මහා කන්නය නොවන බව අදහස් වන අතර, අකල >අයල > යල යනුවෙන් වරනැගී ඇති බව පැහැදිලි වේ තුන්වැනි ගොවිතැන් කන්නය " මදෙහස" (මැද හස ) ලෙස නම් යෙදුනේ ඉහත කාල දෙක අතර පැවතී නිසා යැයි සිතීම වඩාත් උචිත වේ. එමෙන් ම බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී පවා කන්න තුනක් ගොවිතැන් කළ බව ඩේවිගේ පහත ප්‍රකාශයෙන් හෙළිවේ. එනම් " සාරවත් කෙත් වලින් වසරකට දෙවරක් අස්වැන්න ලැබිය හැකි අතර, තෙවරක් පවා ලබාගත් බව මට දැනගන්නට ලැබිණ ." මේ අනුව මෙරට ජනයා කන්න තුනක් වගාකළ බැව් පැහැදිලි වේ .

එමෙන් ම එකල භාවිතා වූ ධාන්‍ය වර්ග ඇතුළු ආහාර වර්ග පිළිබඳව තොරතුරුත් එම ගිරි ලිපියෙන් හෙළිවේ. එකල පැවති ආර්‍ය වංශ පිංකම් වලදී භික්ෂු සංඝයාගේ සිව්පසය උදෙසා වී උඳු, මුං, තල, පැණි , මී පැණි , සහ දුංතෙල් ආදිය ද ආහාර වේල් සඳහා භාවිතා වුනි.

මීට අමතරව "කඩඉම් පොත් විමර්ෂණයෙන්" ද පුරාතන ලංකාවේ වගා කළ විවිධ බෝග සහ, ගම් මට්ටමෙන් එය කළ බවට තුඩු දෙන කරුණු හෙළි වී තිබේ. නිදසුන් : ලෙස බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ "හියු නෙවිල්" පුස් කොළපොත් එකතුවේ තිබෙන "කඩඉම් පොතේ" සඳහන් අන්දමට "කසා, ඉඟුරු, එළු, මිරිස්, ගං තුන්පියක් හා වී වෙල් ලක්‍ෂ ගණන් හා සරක්කු ගං

18 පිටුවට ⇨

අස්වැන්න නැතිව යාමෙන්....
15 පිටුවෙන්

200 ක් සහ උඳු, මුං, තල , කොල්ලු ආදී අෂ්ට විධ ධාන්‍ය ගං විසි අටක් හා සිය දහස් ගණන් පොල් වතු" යන පාඨය උපුටා දැක්විය හැකිය .

එමෙන් ම පුරාණ ලංකාවේ වී වර්ග රාශියක් පැවතී බවට සාධක ඇත . ජොයින් වයිල් ( නෝර්ත් අත් පිටපත් ) අනුව වී වර්ග හතරක් ඇති බවත් ඉන් වර්ග තුනක් කඳුකර ප්‍රදේශ වල වැවෙන අතර ඒවාට නිතර ජලය අවශ්‍ය නොවන බවද සඳහන් වේ . මුත් ( 1824 ) ගොඩ වී ද ඇතුලත්ව වී වර්ග 160 ක් තිබුණු බව දක්වයි . නමුත් මේවායින් බොහොමයක් මුල් වී වගී වල උප - වගී වේ . කෙසේ වුවද නොක්ස්ගේ සහ පූජාවලියේ සඳහන් කරුණු අනුව විවිධ වී වර්ග සහ ඒවා පැසීමට ගත වන කාලයත්, පිළිබඳව අදහසක් ලබා ගත හැකිය . එනම් **මාවී පැසීමට හත් මසක්ද හීනටි සදහා හාර මසක් ද, හාතියාල් පැසීමට හය මසක් ද, හොඩරවාල නම් වී වගීය පස් මසකින් ද, ඇල්පත්කල් තුන් මසකින් ද** පැසෙන බැව් නොක්ස් සඳහන් කරයි . එලෙසම මේ සියළු වී වර්ග බොහෝ දුරට එක හා සමාන වූ අතර **ඉක්මණින් පැසෙන වී රසයෙන් වැඩි අතර අස්වැන්නෙන්** අඩු බව හෙතෙම වැඩිදුරටත් පවසයි . නොක්ස්ගේ ප්‍රකාශය අනුව, ලබා ගත හැකි ජල ප්‍රමාණය මත වගා කරන වී වගීය තීරණය කරන අතර මෙය සාමූහික සාකච්ඡා මගින් තීරණය කෙරෙන බැව් ආචාර්ය කුමාරස්වාමීහු වැඩිදුරටත් සනාථ කරති .

ඇතැම් ප්‍රදේශ වල තවමත් ව්‍යවහාර වන අන්දමට එකලද කුඹුරු වල විශාලත්වය නොහොත් ප්‍රමාණය තීරණය කිරීමට වපසරිය ඉවහල් කර ගත් බවට ගඩලාදෙනි පර්වත ලිපියේ පහත දැක්වෙන "ඉලුපැන් දෙණියෙන් පිදු මුල් බිජ සාමුණෙක් යන පාඨය නිදසුනක් ලෙස දැක්විය හැක . සංස්කෘතිකමය වටිනාකමින් මෙන් ම අනන්‍යතාවයකින් යුත් බොහෝ චාරිත්‍ර විදි මෙරට ජන කොටස් අතුරින් ගිලිහී යාමේ දී මෙම ගොවිතැන් ක්‍රමය හා බැඳී පැවති යම් යම් උදාර ලක්ෂණ නිරායාසයෙන් ම මැකී ගොස් ඇත . සුභ නැකතකින් තම කෙතේ සියළු වැඩ කටයුතු ආරම්භ කිරීමට එකළ ගොවිහු උත්සහා දැරූ අතර කෙම් පහන් ක්‍රම මගින් වගාවන් ආරක්ෂා කර ගත්හ. නොක්ස් සහ ඩේවි පවසන අන්දමට ඔවුහු කිසි විටකත් පොහොර වගී භාවිතා නොකළෝය .

සී සෑමේ සිට බත් අනුභවය දක්වා සෑම කටයුත්තක්ම නියම වේලාවට ආරම්භ කළ ඔවුහු නක්ෂත්‍රානුකූලව නගුල් චක්‍ර, දෑ කැති චක්‍ර ආදී චක්‍ර ආශ්‍රිතව ගොවිතැන් අරඹා අවසානයේ අටු වලින් වී වියදම් කිරීමට සහ අනුභවය ආදී සෑම කටයුත්තටම සුභ මුහුර්ත අනුගමනය කළෝය . නිදසුනක් ලෙස නැකැත් 27 අතුරින් රවිට අයත් කැති, සඳුට අයත් රෙහෙන, රාහුට අයත් අද, සියාවස, සිකුරුට අයත් බෙරණ, බුදට අයත් අස්ලිස ඈදි නැකැත් හැර ඉතිරි නැකැත් ද සුභ තිථි, හෝරා, කරණ ආදිය බලා සඵල රාශියක සුභ ග්‍රහයන් පිහිටුවා නැකත් තනා ගත්හ. මේ අතර පුෂ්කර යෝග අතුරින් ත්‍රි පුෂ්කර යෝග වලට ප්‍රමුඛස්ථානයක් හිමිවූයේ එමගින් වැඩි ඵලදාවක් ලබා ගත හැකි යයි යන මතය නිසාය .

මුහුතී චින්තාමණිය වැනි සුභ මුහූර්ථ සාදනය සඳහාම ලියවුන ග්‍රන්ථ දෙස බැලීමෙන් වී සඳහා මෙන්ම විවිධ බෝග වර්ගය සඳහා වෙන වෙනම නැකැත් තිබූ බවද හෙළිවේ. පහත සඳහන් කවි වලින් ඒ බව පැහැදිලි වේ .

47 කව :

හැම වී වපුට යු තු
දක්වා නැකැත් ගත යු තු
වෙනබිජු වපුට යු තු
නැකැත් වෙනවෙන
දනුව මින් ම තු

48 කව :

**සෙනසුරු දින මැද කල් උනු
තැන කළුවී හැම වපුර නු
දින එම හිරු ලග්නේ උනු
ගෙන රත්හැල් හැම වපුර නු**

ගොයම් මැඩීමේ දී අශුද්ධ ආහාර **සහ** මළ ගෙයක් වැනි **අපිරිසිදු ගෙයකින් පැමිණෙන කාන්තාවන්ට කමතට ඇතුළු විමට අවසර** නොලැබෙන අතර , විවිධ කමත් **සිරිත් ඔවුන්** අතර පැවතිණි. **මෙතරම් උසස්** ගෞරවයක් මෙම කාර්යයට **ඔවුන් දැක්වූයේ** එය දේව කාර්යයක් හා සමාන කොට **සැලකූ** බැවිනි . මෙම ගුණාංග අද **සමාජයෙන්** ගිලිහී ගොස් ඇති අතර , **කමත් චාරිත්‍ර වෙනුවට**, මෙම **කාර්යය මධ්‍යසාර පානයෙන් තොරව** කරගත නොහැකි **තත්ත්වයක් වර්තමානයේ** උද්ගතව ඇත . වර්තමාන **සමාජය** ගිලගෙන ඇති **වාණිජ රැල්ල** නිසා අනාගතයේ මෙරට ජනතාවගේ **කෘෂිකාර්මික** අනන්‍යතාවය ට්‍රැක්ටර් කොළ මඩින යන්ත්‍ර ආදී **කාර්මික** මෙවලම් සහ **කෘෂි** රසායනික ද්‍රව්‍ය, රසායනික පොහොර වැනි යෙදවුම් විසින් **හිමි** කරගනු ඇත. **එපමණක් නොව ජාතික වස්තුවක්** මෙන්ම **උරුමයක්** ලෙස සැලකිය යුතු මෙරට "**ජාන සිටුවේ**" අයිතිය ද ගිලිහෙමින් පවතින අතර **එය රැක ගැනීමට වෙර දැරීම** ජාතික මෙහෙවරකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. පුරාතන ලංකාව , ඩබ් . ඒ . ජයවර්ධන, 1964, ගුණසේන පිට 68 - 69

2. සිංහල ශිලා ලේඛන විවරණය, ධම්බන්දු අමරසේකර, 1 වන කාණ්ඩය, ගුණසේන 1961 පිටු 80 - 84,

3. ඩේවි දුටු ලංකාව, වෛද්‍යාචාර්ය ජෝන් ඩේවි, අනුවාදය ඇල්ලේපොල එච් . එම්. සෝමරත්න, ගුණසේන, පිටු 139 - 143 ,

4. එදා හෙලදිව, රොබට් නොක්ස්, අනුවාදය ඩේවිඩ් කරුණාරත්න, ගුණසේන 1959, පිටු 71,

5. පූජාවලිය, පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල හිමිගේ සංස්කරණය, ගුණසේන, 1986 පිට376 - 778.

6. පූජාවලිය , සූරවීර සංස්කරණය (33- 34) පරිච්ඡේද, ගුණසේන, 1961 පිට 37

7. මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය, විල්හෙලම් ගයිගර්, පරිවර්තනය ආචාර්ය ඇම්. බී . ආරියපාල, ගුණසේන, 1969, පිට 125.

8. **චූළ රාජාවලිය,ඩී . පී. ආර්. සමරකෝන්, ටීකාසහිත ත්‍රි ප්‍රෙස් සමාගම 1959 පිට 13.**

9. රාජාවලිය, සූරවීර සංස්කරණය, 1976, පිට 19.

10. **කඩඉම් පොත් විමර්ෂණය , එච් . ඒ. පී. අභයවර්ධන, සංස්කෘතික දෙපාර්තමේන්තුව 1978. පිටු 163 - 217**

11. මුහුතී චින්තාමණී, දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි, රත්නාකාර පොත් සමාගම පිට 4 .

12. මධ්‍ය කාලීන සිංහල කලා, ආචාර්ය ආනන්ද, කේ. කුමාරස්වාමි, පරිවර්තනය එච් . ඇම්. සෝමරත්න, 1962 පිට 29.

13. ජිවිතය සහ ග්‍රහයෝ , හෙන්ද්‍රික් ද සිල්වා හෙට්ටිගොඩ මහතා, රත්න පොත් 1980 පිටු 387 - 388

14. නැකැත් සෑදීමේ කෙටි ක්‍රම , ඩී බී හෙට්ටිගේ **1985** පිට **38** .